// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2333/12 - 2023 මැයි මස 22 වැනි සඳුදා - 2023.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : කඩු/ඉඩම්/01/141/ඩබ්එස්II.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*රජයට පැවරී ඇති ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 475/ඒ මහදෙණිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වැලිවිට ගමේ පිහිටි සර්වෙයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති ක.සි. 522013හි කලාප අංක 02 පත්‍ර අංක 1 හා 2023.04.28 දින කැඩැස්තර සිතියමේ කැබලි අංක 1 හා 2 වශයෙන් පෙන්නුම් කරන පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි :

**01. කැබලි අංක 01**

ඉඩමේ නම: කුරුඳුගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, අධිබලැති විදුලි කණුවක කොටසක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: භූමි රියල්ටි (පුද්) සමාගම; ප්‍රමාණය: හෙක්ටයාර් 2.6845

02. කැබලි අංක 02

ඉඩමේ නම: කුරුඳුගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: ප්‍රේමසිරි සෙනෙවිරත්න; ප්‍රමාණය: හෙක්ටයාර් 0.6885

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 ජුනි මස 05 වැනි දින පෙ.ව. 9.30 ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2023 ජුනි මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. එස්. සම්පත් ඉඩම්ගොඩගේ,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2023 මැයි මස 22 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05 - 0205

1A - G 039567 – 14 (2023/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*